JUNE

# CURRENT ISSUES

Alcohol and Drug Information Centre

# හැඳින්වීම

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC ආයතනය) වසර 30 කට වැඩි කාලයක් දුම්වැටි, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය වලින් ජනතාව නිදහස් කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටියි. එම වැඩසටහන් අතර දුම්වැටි මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වීමට බලපාන සාධක නිරන්තරයෙන් සොයා බලා ඒ පිළිබඳව ජනතාව සහ අදාළ බළධාරින්ගේ අවධානයට යොමු කරමින් ඒවායේ බලය අඩු කිරීමටත් එම බලපෑම් නතර කිරීම සඳහාත් කටයුතු කරයි.

ඒ අනුව ආයතනයේ පුස්තකාල හා තොරතුරු අංශය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුවත්පත් වන සිළුමිණ, දිනමිණ, දිවයින, මව්බිම, ලංකාදීප, අද, අරුණ, මොණරා ආදී පුවත්පත් දිනපතා විශ්ලේෂණයක් සිදු කරයි. මීට අමතරව විද්‍යුත් මාධ්‍ය නාලිකා කිහිපයක්ද නිරීක්ෂණය කරයි. එහිදී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කරයි.

- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම
- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අධෛර්යමත් කිරීම
- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් සිදුකිරීම

මෙම වාර්තාව තුළ ඉහත කරුණු පුවත්පත්වල හා රූපවාහිනියේ විකාශය වන ටෙලිනාට්‍ය හරහා වාර්තා වී ඇති ආකාරය කෙසේද යන්න සම්බන්ධව සඳහන් වී ඇත. මෙහි අරමුණ වන්නෙ පුවත්පත් තුළ දුම්වැටි, මද්‍යසාර සහ අනිකුත් මත්ද්‍රව්‍ය වලින් සිදුවන ප්‍රවර්ධනයන් අවම කිරීම සහ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව සිදුවන ධනාත්මක පළ කිරීම් පිළිබඳව ජනතාව සහ අදාළ බළධාරීන් දැනුවත් කිරීමයි.

# PRINT MEDIA

## PROMOTIONS











මද්‍යසාර සමාගම් විවිධ ආකාරයෙන් තරුණ තරුණියන් ඉලක්ක කරයි. ඇතැම් පුවත්පත් වල තරුණ තරුණියන් මද්‍යසාර භාවිතා කරන රූප ආකර්ෂණීය ලෙස පළ කිරීම මඟින් මද්‍යසාර භාවිතයට වටිනාකමක් ආරෝපණය කරමින් භාවිතය ප්‍රවර්ධනය කිරීමට ඇතැම් පුවත්පත් කටයුතු කරයි.





# PRINT MEDIA

## PREVENTION



**ගම්පහ මත්ද්‍රව්‍ය තොරතුරු වාර්තාකරණ වැඩමුළුවක්**

■ ගම්පහ තිලකරත්න දිසානායක

**ගෝලීය ගැටලුවක් බවට පත්ව ඇති මත්ද්‍රව්‍ය භාවිතය හා එයට එරෙහි සමාජ මතයක් ගොඩනැගීම සඳහා නිවැරදි මාධ්‍යකරණය පිළිබඳ දැනුවත් කිරීමේ එක් දින වැඩසටහනක්, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය අග්‍රා ශාලාවේදී පැවැත්විණි.**

දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි මාධ්‍ය සම්බන්ධීකරණ වගකීම දරන නිලධාරීන් හා මාධ්‍යවේදීන් වෙනුවෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් මෙම වැඩසටහන සංවිධාන කර තිබුණි. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී සැලකිය යුතු අවශ්‍යතා සහ දරුවකු මත්ද්‍රව්‍ය අත්හදා බැලීමකට නොයන තත්ත්වයකට දැනුවත් කිරීමේ අවශ්‍යතාව මෙහිදී පෙන්වා දෙනු ලැබීය.

ගම්පහ දිසාපති ලලිත්ද ගමගේ සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති වෛද්‍ය ඉන්දික වන්නිනායක යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනේදී එම මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (නිවාරණ අධ්‍යාපන හා පුහුණු) ප්‍රදීප් කොහොලානේගෙදර, එහි මාධ්‍ය ප්‍රකාශක චාමර කරුණාරත්න සහ ගම්පහ දිස්ත්‍රික් සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන නිලධාරිනී හර්ෂනී ආරියරත්න යන මහත්ම මහත්මීන් විසින් දැනුවත් කිරීම කරන ලැබීය.

මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වීමට බලපාන සාධක අතර ප්‍රධාන සාධකයක් බවට පුවත්පත් මඟින් සහ රූපවාහිනියේ විකාශය වන ටෙලිනාට්‍ය හරහා ප්‍රචාරණය වන අවස්ථා ගත හැකිය. මෙහිදී ජනමාධ්‍යවේදීන් විසින් දුම්කොළ හා මද්‍යසාර සමාගම් වල අරමුණු ඉටුකර ගැනීමට මුදල් මත කටයුතු කරන අවස්ථා සහ ඔවුන්ගේ නොදැනුවත්කමින් සිදුවන ප්‍රචාරණයන් ද ඇතුළත් වේ. එමනිසා මත්ද්‍රව්‍ය නිවාරණයේදී නිවැරදි මාධ්‍යකරණය භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම සඳහා මෙවැනි නිවාරණ වැඩසටහන් සිදු කිරීම පිළිබඳව අගය කළ යුතුය.



**දරුවන් මතින් මුදා ගනිමු බෙම්මුල්ලේදී දේශනයක්**

**අනාගත දරු පරපුර මත් උවදුරින් මුදා ගැනීම සඳහා වූ උපාය මාර්ග පිළිබඳ විශේෂ දේශනයක් බෙම්මුල්ල ශ්‍රී වර්ධනාරාම පිරිවෙන් විහාරස්ථානයේදී පසුගියදා පැවැත්විණි.**

බෙම්මුල්ල ශ්‍රී වර්ධනාරාම පිරිවෙන් විහාරස්ථ බණ්ඩාරනායක දහම් පාසලේ ප්‍රධානාචාර්ය කුඩාගම සමිත හිමියන්ගේ අනුශාසකත්වයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය

බෙම්මුල්ල සමෘද්ධි බැංකු සංගමයේ කළමනාකාරිනිය ඇතුළු සමෘද්ධි සංවර්ධන නිලධාරිහු මෙය සංවිධානය කළහ.

සමාරම්භක අවස්ථාවට සහභාගී වූ අත්තනගල්ල සමාජ සංවර්ධන නිලධාරී පියල් සමෘද්ධි බැංකුවේ කළමනාකාරිනි සුධාතා හපු ආරච්චි යන මහත්ම මහත්මීහු ඡායාරූපයේ වෙති

දුම්කොළ සහ මද්‍යසාර ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය සමාගම් වල දරුවන් තවත් ප්‍රධාන ඉලක්කයන් බවට පත් වී ඇත. එමනිසා මෙවැනි මත්ද්‍රව්‍ය භාවිතයට දරුවන් යොමු වීම වැළැක්වීම සඳහා ගන්නා උත්සාහය අගය කළ යුතුය.

එසේම ඔවුන්ට මත්ද්‍රව්‍ය සතුටට බාධාවක් බවත්, සමාගම්වල කූට උපක්‍රම පිළිබඳවත් අවබෝධය ලබා දිය යුතුය.

# PRINT MEDIA

## LAW ENFORCEMENT


ගංජා කිලෝ 5ක් යතුරුපැදියෙන් අදිද්දී පුද්ගලයෙක් මාට්ටු

ගාල්ල - ෆර්හාන් නිසාමුදීන්


රු.කෝටි 2ක කේරළ ගංජා සමග පොලිස් සැරයන් ඇතුළු 6ක් දැලේ

බණ්ඩාරගම - බිමල් ශාමන් ජයසිංහ


ගංජ ගහලා රාජකාරි කළැයි පීසීගේ වැඩ තහනමට

බණ්ඩාරගම - බිමල් ශාමන් ජයසිංහ

ගංජා පානය කර බුද්ධි සහ ආවේක්ෂණ රාජකාරි සිදු කළ බව කියන පොලිස් කොස්තාපල්වරයකුගේ වැඩ තහනමට ලක් කළ බව පොලිස් මූලස්ථානය කියයි.


ලක්ෂ 100ක ගංජා තොගයක් ඇඹිලිපිටියෙන් අත්අඩංගුවට

කහවත්ත - සමරවීර නිරෝෂණ

ගංජා භාවිතය නීතිගත කිරීම සඳහා විවිධ උත්සාහයන් පසුගිය කාලය තුළ දැකගත හැකි විය. ගංජා අපනයනය කර දැවැන්ත ආර්ථික වාසියක් අත්පත් කරගත හැකි බවත් පවසමින් ගංජා වගාව රට තුළ ආරම්භ කිරීමට මෙම ව්‍යාපාරයේ නියෝජිතයන් විවිධ උත්සාහයන් ගනිමින් සිටියි.

ආරක්ෂක අංශ වල මැදිහත්වීම යටතේ මහජනතාවට බලපෑමකින් තොරව ගංජා වගා කර අපනයනය කළ හැකි බව ගංජා ප්‍රවර්ධනය කරන්නන්ගේ තර්කයකි. මෙහි ප්‍රායෝගික තත්ත්වය නම් දැනටමත් ආරක්ෂාවන් යටතේ ගංජා වගා කළ සහ නිෂ්පාදනය කළ රටවල මේ වන විට නීතිවිරෝධී ගංජා ව්‍යාපාරය දැඩි ලෙස ව්‍යාප්ත වී ඇති බවයි. එසේම ආරක්ෂක අංශ වල ඇතැම් නිළධාරීන් ගංජා ජාවාරමේ නිරත වූ අවස්ථාවන් මාධ්‍ය තුළින් දැකගත හැකිවීම තුළින් ද මෙය ප්‍රායෝගික නොවන තත්ත්වයක් බව නැවත නැවත ඔප්පු වේ.

ගංජා සිගරට් ලෙස උරාබීම නිසා දුම්පානයේදී සිදුවන හානි වලින් විශාල ප්‍රමාණයක් ගංජා භාවිතයෙන් ද සිදුවන බව පැහැදිලිය.

ලෝකයේ සිගරට් අළෙවිය දිනෙන් දින පහළ යාම නිසා දුම්කොළ සමාගම් වල මේ තර්ජනයට මුහුණ දීම සඳහා ඔවුන්ගේ ඊළඟ ව්‍යාපාරය ලෙස ගංජා සඳහා ආයෝජනය කිරීම ආරම්භ කර ඇත. එමනිසා ගංජා භාවිතයට ඔවුන්ගේ නව පාරිභෝගිකයන් නිර්මාණය කර ගැනීම සඳහා විවිධ උපක්‍රමයන් යොදවමින් සිටියි.

# DIGITAL MEDIA

## PROMOTIONS

**2006 අංක 27 දරණ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත මගින් දුම්කොළ සහ මද්‍යසාර ප්‍රචාරණය තහනම් කර තිබියදීත් රූපවාහිනී නාලිකාවල මද්‍යසාර ප්‍රචාරණය කරන ආකාරය සහ විශේෂයෙන් කාන්තාවන් මද්‍යසාර භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම මේ දිනවල සුලභව දැකිය හැකිය. එය මද්‍යසාර සමාගම් ප්‍රබලව භාවිතා කරන උපක්‍රමයකි.**







**ITN නාලිකාවේ සති අන්තයේ විකාශය වන 'වීදුරු තිර' ටෙලි නාට්‍ය තුළ මද්‍යසාර භාවිතය ප්‍රවර්ධනය කරමින් කාන්තාවන් තුළ භාවිතය සාමාන්‍යකරණය කිරීමට ගන්නා උත්සාහය.**







**ස්වර්ණවාහිනී නාලිකාවේ සතියේ දිනවල විකාශය වන 'ජුරාලියා' ටෙලි නාට්‍ය තුළ මද්‍යසාර භාවිතය ප්‍රවර්ධනය කරමින් තරුණ තරුණියන් අතර භාවිතය සාමාන්‍යකරණය කිරීමට ගන්නා උත්සාහය.**

**රටක පවතින නීතියක් කලාව නාමයෙන් හෝ නිර්මාණ නාමයෙන් උල්ලංසනය කළ හැකි ද?**

# ජනමාධ්‍යක සමාජ මෙහෙවර නම්!